**ලංකා සෝල්ට් ලිමිටඩ් සමාගම - 2017**

-----------------------------------------------

ලංකා සෝල්ට් ලිමිටඩ් සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

-----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේදී හා ඊට පෙර වර්ෂ 2 කදී දකුණු පළාත් සභාවට ගෙවන ලද රු.27,828,598 ක ඛනිජ බදු මුදලක් ආපසු අයකර ගැනීම සඳහා එම පළාත් සභාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති නඩුවක් පදනම් කරගෙන 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ඛනිජ බදු ලෙස ජංගම වත්කම් යටතේ හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද එම මුදල ආපසු අයකර ගැනීමේ හැකියාව පිළිබඳව ස්ථිර තහවුරුවක් සමාගමට නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) 2016 වර්ෂයේදී සමාගම විසින් නිෂ්පාදිත හා 2017 වර්ෂයේ දී බාහිර පාර්ශවයන්ගෙන් මිලදීගත් රු.283,803,105 ක් වටිනා කර්මාන්ත ලුණු මෙට්‍රික් ටොන් 17524 ක තොගයක් 2017 දෙසැම්බර් 31 දිනට අවසන් තොගයේ ඇතුළත්ව තිබුණි. තත්ත්වයෙන් බාල බවට රසායනාගාර පරීක්ෂණවලින් තහවුරු වී ඇති මෙම තොගය විකිණීමට හෝ වෙනත් අපේක්ෂිත කාර්යයන්ට යොදාගැනීමට නොහැකිව පවත්වාගෙන ගිය ද හානිකරණයන් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) ප්‍රමිතයේ 4 පරිච්ඡේදයේ 4.4 හා 4.5 ඡේද අනුව වාර්තාකරණ දිනෙන් මාස 12 ක් තුල කල්පිරෙන මූල්‍ය වත්කම් ජංගම වත්කම් යටතේ සහ ගිණුම් වර්ෂය අවසන් වී මාස 12 කට වැඩි කාලසීමාවක් තුල කල්පිරෙන මූල්‍ය වත්කම් ජංගම නොවන වත්කම් යටතේ දැක්විය යුතු වුවද, වර්ෂයකට අඩු කාලසීමාවකින් කල්පිරෙන රු. 241,336,993 ක් වූ ස්ථාවර තැන්පත් ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඈ) ප්‍රමිතවල 17 පරිච්ඡේදයේ 17.19 ඡේදය ප්‍රකාරව ජංගම වත්කම් සඳහා ඵලදායි ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.142,975,659 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල 10 පරිච්ඡේදයේ 10.15 හා 10.18 ඡේදය අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ප්‍රමිතයේ 20 පරිච්ඡේදයේ 20.13 ඡේදය අනුව රු.29,856,170 ක් වූ කල්බදු මෝටර් වාහන හා අත්ට්‍රැක්ටර්, කල්බදු දේපළ යටතේ වෙනම දැක්වීම වෙනුවට දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

(ඊ) ප්‍රමිතවල 29 පරිච්ඡේදයේ 29.16 ඡේදය ප්‍රකාරව විලම්භිත බදු වත්කම හඳුනාගැනීමේදී සියළුම අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් ( deductible temporary differences) සැලකිල්ලට ගත යුතුය. එසේ වුවද සමාගම විසින් විලම්භිත බදු වත්කම තීරණය කිරීමේදී බද්දට යටත් නොවන ප්‍රදාන සහ සහනාධාර ද (Grants and subsidies) අඩුකළ හැකි තාවකාලික වෙනස්කමක් ලෙස හඳුනාගෙන තිබීම හේතුවෙන් සමාගමේ විලම්භිත බදු වගකීම රු.9,945,892 ක් අඩුවෙන් පෙන්වන අතර විලම්භිත බදු ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, පිරියත හා යන්ත්‍ර වල වාර්ෂික ක්ෂය අනුපාතය සියයට 10 ක් වුවද, පිරියත යටතේ ගැනෙන Pumps & Accessories සියයට 20 බැගින් ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු.1,255,304 ක් වැඩියෙන් පෙන්වන අතර සමාගමේ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව සේවක වන්දි ගෙවීම සඳහා ලැබෙන ආධාර අදාල වියදමට එරෙහිව අඩු කළ යුතුය. ඒ අනුව, ආධාර ලැබීම් අදාළ වර්ෂය තුලදී ආදායමක් ලෙස හඳුනා ගත යුතුය. එසේ වුවද සේවක වන්දි ගෙවීම සඳහා ලැබී තිබූ රු.4,259,917 ක් වූ ආධාර මුදල වර්ෂ ගණනාවක සිට ජංගම නොවන වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(එ) 2017 දෙසැම්බර් 31 දිනට භෞතික සත්‍යාපනය අනුව පැවති ලුණු තොගය වෙනුවට පොත් අගය අනුව පැවති ලුණු තොගය යොදාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හේතුවෙන් 2017 වර්ෂය සඳහා සමාගමේ ලාභය සහ 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ ජංගම වත්කම් රු. 186,446,426 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) සමාගමේ 2017 වර්ෂයට අදාල ජාතිය ගොඩනැගීමේ බදු වියදම වූ රු. 29,999,726 ක් විකුණුම් වියදම් යටතේ දැක්වීම වෙනුවට දළ විකුණුම් ආදායමෙන් අඩු කර ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඔ) 2017 දෙසැම්බර් 31 දිනට හිස් ඇසුරුම් භෞතික තොග වටිනාකම හා පොත් ශේෂය අතර රු.59,067ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති විගණන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | ගිණුම් විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (i) | Contractor Payables (CECB) කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු | 38,339,359 | තහවුරු කිරීමේ ලේඛන සහ ශේෂ සනාථන ලිපි හා අදාළ පාර්ශවය සමඟ ඇතිකරගත් ගිවිසුම |
| (ii) | **වෙනත් ගෙවිය යුතු තැන්පතු** | | තහවුරු කිරීමේ ලේඛන හා වයස් විශ්ලේෂණ |
| | • PERC ආයතනයෙන් ලද මුදල් | 1,649,500 | |
| | • ප්‍රාදේශීය බදු සඳහා වෙන්කිරීම | 1,073,837 | |
| (iii) | **ගෙවිය යුතු තැන්පතු** | | |
| | • නැවත ගෙවිය යුතු තැන්පතු (Refundable Deposits) | 3,632,645 | |
| (iv) | Grants and Subsidies (ICCIDD ආයතනයෙන් ලද මුදල්) | 35,521,037 | |

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,2017 දෙසැම්බර් 31 දිනට ලංකා සෝල්ට් ලිමිටඩ් සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1 අනෙකුත් නීති හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත පරිදි ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා වන පදනම හා විෂය පථය සහ විගණනයේ සීමාවන් ඉහතින් ප්‍රකාශ කළ පරිදි වේ.

(ආ) මාගේ මතය තුළ :

- විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ කරුණු මා විසින් ලබාගෙන ඇති අතර මාගේ පරීක්ෂණවලින් පිළිඹිබු වන පරිදි සමාගම විසින් විධිමත් ලෙස ගිණුම් වාර්තා තබා තිබුණි.

- සමාගමේ මූල්‍ය වාර්තා 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 සහ 153 වගන්තිවල අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 324,253,841 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.697,848,617 ක ලාභයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 373,594,776 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු. 437,358,223 කින් පහළයාම හා විකුණුම් පිරිවැය රු. 110,500,299 කින් ඉහළයෑම ඉහත පිරිහීම කෙරේ ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.
සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 3 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂයේදී රු.75,108,000 ක ලාභ උපයා තිබූ අතර 2017 වර්ෂය වන විට රු.324,254,000 ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිතෝෂික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් හා රජයට ගෙවූ බදු සැලකීමෙන් පසු 2014 වර්ෂයේදී රු.436,050,000 ක් වූ දායකත්වය 2017 වන විට රු.1,223,815,000 ක් වී තිබුණි.

**3.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය**

-----------------------------------------------

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සමාගමේ වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| අනුපාත | 2017 | 2016 |
|---|---|---|
| දළ ලාභ අනුපාතය (සියයට) | 38.67 | 58.58 |
| ශුද්ධ ලාභ අනුපාතය (සියයට) | 22.14 | 36.69 |
| කොටසක ඉපයීම් (රු) | 92.64 | 199.38 |
| එක් සේවකයෙකුට ආදායම (රු) | 880,269 | 1,652,585 |
| ජංගම වත්කම් අනුපාතය (වාර ගණන) | 1.78 | 0.74 |
| ක්ෂණික වත්කම් අනුපාතය (වාර ගණන) | 0.4 | 0.3 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විකුණුම් වියදම් ඉහළ යාම හේතුවෙන් 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී සමාගමේ දළ ලාභ අනුපාතය සියයට 20 කින් පහළ ගොස් තිබුණි. ශුද්ධ ලාභ අනුපාතය 2017 වර්ෂයේදී සියයට 15 කින් අඩු වී තිබුණ අතර සමාගමේ බෙදා හැරීමේ වියදම්, පරිපාලන වියදම් හා වෙනත් වියදම්වල ඉහළ යාම ඊට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) 2017 වර්ෂයේ සමාගමේ බදු පසු ලාභය 2016 වර්ෂයට සාපේක්ෂව පහළයාම හේතුවෙන් කොටසක ඉපයීම් ද රු.106.74 කින් පහළ ගොස් තිබුණි.

(ඇ) 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ දී සමාගමේ තත්‍ය සේවක සංඛ්‍යාව ඉහළ යාමත් ආදායම අඩුවීමත් හේතුවෙන් එක් සේවකයෙකුට ආදායම රු. 772,316 කින් එනම් සියයට 47 කින් අඩුවී තිබුණි.

(ඈ) 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී තොගයේ ඉහළයාම හේතුවෙන් සමාගමේ ජංගම වත්කම් අනුපාතය 1.04 කින් ඉහළ ගොස් තිබුණද ක්ෂණික වත්කම් අනුපාතයේ ඉහලයාම 0.1 ක් පමණක් විය. ඒ අනුව සමාගමේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය ප්‍රශස්ථ මට්ටමක නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී බෙදාහැරීමේ වියදම් යටතේ ප්‍රචාරණ වියදම් ලෙස රු.25,984,581 ක් ද විකුණුම් ඉලක්ක වියදම් (Sales Target expenses) ලෙස රු.25,639,398 ක්ද වැයකර තිබුණද වර්ෂයේ විකුණුම් ආදායම සියයට 23 කින් පහළ ගොස් තිබුණි. බෙදාහැරීමේ වියදම් යටතේ වැටුප් හා වේතන වියදම ද ප්‍රවර්තන වර්ෂයේදී සියයට 31 කින් ඉහළ ගොස් තිබුණි.

## 3.3 ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

-----------------------------------------------------------------

වාර්ෂික ආදායමෙන් සියයට 0.5 ක් ඛනිජ බදු ලෙස අයකිරීම සම්බන්ධයෙන් සමාගම විසින් පළාත් ආදායම් කොමසාරිස් (දකුණු පළාත) සහ භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂකට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනුකර තිබූ අතර සමාගමේ හිටපු සේවකයින් 05 දෙනෙකු විසින් විනය ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීම සම්බන්ධයෙන් සමාගමට එරෙහිව නඩු පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

### 4.1 කාර්යසාධනය

----------------------

### 4.1.1 සැලසුම් කිරීම

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යසාධනය ඇගයීම සඳහා කාර්යසාධන වාර්තාවක් පිළියෙල කිරිමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ආ) සමාගම විසින් මිලදීගන්නා ලුණු සහ අනෙකුත් භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණි.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------------------

සමාගමේ ලුණු අට්ටි (Industrial Salt)ලේඛන නඩත්තු කිරීමේදී ට්‍රැක්ටර් ලෝඩ් ගණන පදනම් කරගෙන දෛනික ලැබීම් යාවත්කාලීන කරනු ලබන අතර නිෂ්පාදනාගාරය වෙත ලුණු තොග නිකුත් කිරීමේදී පාලම් තරාදිය (Weight Bridge) මඟින් බර මිනුම් කර එම ප්‍රමාණය නිකුත් කිරීම් ලෙස යාවත්කාලීන කරනු ලැබේ. එහිදී ඇතිවන වෙනස අට්ටි ලුණු වල අපතය ලෙස හඳුනාගෙන තිබුණි. මාසික විකුණුම් හා තොග වාර්තා අනුව 2017 වර්ෂය තුළදී මෙට්‍රික් ටොන් 6614 ක අපතයක් එසේ හඳුනාගෙන තිබූ අතර එය 2017 දෙසැම්බර් 31 දිනට අට්ටි ලුණු තොගයේ ප්‍රමාණයෙන් සියයට 10 ක් පමණ විය. අට්ටි ලුණුවල අපතය හඳුනාගැනීමට විධිමත් ක්‍රමයක් සමාගම අනුගමනය නොකරන අතර ඉහත පරිදි හඳුනාගන්නා ලද අපතය අට්ටි ලුණු ලැබීම් හා නිකුත්කිරීම් ක්‍රම දෙකකට යාවත්කාලීන කිරීම හේතුවෙන් ඇති වූ වෙනස බැවින් එය සත්‍ය වශයෙන් ඇතිවූ අපතයක් ද යන්න නිරීක්ෂණය නොවුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොහොලංකල අක්කර 20 ක භූමියක ඉදිකරනු ලබන වාෂ්පීකරණ තටාක ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අදාල ඉදිකිරීම් කටයුතු බාහිර පාර්ශවයක් ලවා ඉටුකරගනු ලැබුවද විධිමත් ගිවිසුමක් අත්සන් කර නොතිබූ අතර ගෙවිය යුතු මුදලට හිලව්වන ලෙස තටාක සකස් කිරීමේදී ඉවත්කරනු ලබන වැලි හා පස් අදාල කොන්ත්‍රාත්කරු වෙත ලබා දුන්නද ඒවායේ ප්‍රමාණයක් පිළිබඳව විධිමත් එකඟතාවයකට පැමිණ නොතිබුණි.

(ii) 2007 ඔක්තෝබර් 03 දිනැති සේවා කොන්දේසි ලිපිය පරිදි වර්තමාන වෙළඳපල අගයට බෙහෙවින්ම අඩු අගයක් මත වැලි කියුබ් 1 ක් සඳහා රු.1,500 ක්ද පස් කියුබ් 1 ක් සඳහා රු.200 ක් ද ලෙස මිල ගණන් දක්වා එම මිල ගණන් මත කොන්ත්‍රාත්කරු විසින් වැලි හා පස් ඉවත් කර ගෙන තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් ඉවත්කරගන්නා වැලි, පස් හා අනෙකුත් ද්‍රව්‍ය පිළිබඳ වාර්තා තැබීමක්ද සිදු නොකරන බව නිරීක්ෂණය විය.

## 4.4 අනාර්ථික ගනුදෙනු

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ මුල්‍ය ප්‍රකාශනවල ජීව විද්‍යාත්මක වත්කම් යටතේ පෙන්වන මහලේවායේ හා බුන්දල ලේවායේ පවත්වාගෙන යනු ලබන පොල් වගාවන් වෙනුවෙන් 2017 වර්ෂය තුළදී අමුද්‍රව්‍ය සඳහා සහ සේවක මණ්ඩල වියදම් ලෙස පිළිවෙලින් රු. 271,469 ක් සහ රු.7,444,817 ක් වශයෙන් වියදම් දරා තිබුණි. එම වගාවන්ගෙන් සමාලෝචිත වර්ෂය තුළ ලද ආදායම රු. 198,900 ක් පමණක් වූ බැවින් පොල් වගාවන්ගේ නඩත්තු කටයුතු වෙනුවෙන් දරන ලද වියදම අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය.

(ආ) 2016 වර්ෂයේදී මහලේවාය වෙනුවෙන් නියමිත කාලයේදී බදු මුදල් නොගෙවීම හේතුවෙන් රු. 737,100 ක දඩ මුදලක් 2017 වර්ෂයේදී ගෙවීමට සිදුවී තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (ඩී) වගන්තිය අනුව සමාගමේ සංවිධාන සටහන හා අනුමත සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 9.2 (ඒ) වගන්තිය අනුව සමාගමේ අනුමත සේවක සංඛ්‍යාව සංයුක්ත සැලැස්මේ ඇතුළත් කළ යුතුය. එසේ වුවද 2017 සිට 2020 දක්වා කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මේ සමාගමේ අනුමත සේවක සංඛ්‍යාව දක්වා නොතිබුණි.

(ඇ) ඉහත චක්‍රලේඛයේ 9.3.1 ප්‍රකාරව සමාගමට බඳවා ගැනීම් හා උසස් කිරීම් ක්‍රමවේදයක් සහ එහි 9.14 ප්‍රකාරව මානව සම්පත් කළමනාකරණය සඳහා වූ අත්පොතක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) සමාගමේ 2016 හා 2017 වර්ෂයන්ට අදාළව කාර්ය මණ්ඩල තොරතුරු පහත දැක්වේ.

| | 2017 දෙසැම්බර් 31දිනට | | | | 2016 දෙසැම්බර් 31 දිනට | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | අතිරික්ත කාර්ය මණ්ඩලය | කාර්ය මණ්ඩල ඌනතාවය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | අතිරික්ත කාර්ය මණ්ඩලය | කාර්ය මණ්ඩල ඌනතාවය |
| මාණ්ඩලික | 71 | 53 | 05 | 23 | 63 | 44 | 04 | 23 |
| මාණ්ඩලික නොවන | 588 | 526 | 46 | 108 | 410 | 396 | 35 | 49 |
| කණිෂ්ඨ | 755 | 1085 | 411 | 81 | 563 | 711 | 208 | 60 |
| | **1414** | **1664** | **462** | **212** | **1036** | **1151** | **247** | **132** |

සමාගමේ 2016 වර්ෂයේදී 1036 ක් වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කාර්ය මණ්ඩලය 2017 වර්ෂයේදී 1414 දක්වා 378 දෙනෙකුගෙන් වැඩි කර තිබූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය ද 513 කින් වැඩි වී තිබුණි.

(ඉ) පිරිස් බල ව්‍යුහය අනුව 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ අතිරික්ත සේවක සංඛ්‍යාව 462 ක් වන අතර එම අතිරික්ත සේවක සංඛ්‍යාව තුළ ස්ථිර සේවකයින් 31 ක් ද අනියම් සේවකයින් 07 ක්ද වාරික සේවකයින් 424 ක්ද විය. පිරිස් බල ව්‍යුහය අනුව, එදිනට සමාගමේ පුරප්පාඩු සේවක සංඛ්‍යාව 212 ක් විය. සමාගමේ පරිපාලන අංශය, ගිණුම් අංශය හා අභ්‍යන්තර විගණන අංශය ඇතුළු සෑම අංශයකම පාහේ වාරික සේවකයින් අතිරික්තව සේවයේ යොදවා ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

**4.6 වෙළඳපොල කොටස**

සමාගමට හිමි වෙළඳපොල කොටස තීරණය කිරීම සඳහා කාලීනව වෙළඳපොල සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව සමාගම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සමාගම විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**6.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලින්**

**6.1 .1 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

සමාගමේ අනාගත ලුණු අවශ්‍යතාවය සම්බන්ධයෙන් අවශ්‍යතා විශ්ලේෂණයක්, නිෂ්පාදන විශ්ලේෂණයක් හෝ විභව අලෙවි විශ්ලේෂණයක් හෝ සිදුකිරීමෙන් තොරව 2017 වර්ෂය තුළදී සමාගම විසින් බාහිර පාර්ශවයන්ගෙන් ලුණු මෙට්‍රික් ටොන් 13,515.52 ක ප්‍රමාණයක් රු.268,637,460 කට මිලදී ගෙන තිබුණි. ඒ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නිසි පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව සැපයුම්කරුවන් තෝරාගෙන තිබූ අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ වීමටත් පෙර සිටම ලුණු තොග සමාගම වෙත ලැබීම් මතභේදාත්මක කරුණක් වී තිබුණි.

(ii) තෝරාගත් සැපයුම්කරුවන්ගේ ලුණු සාම්පලවල නියැදි පරීක්ෂා කිරීමේදී ඒවා සම්මත පිරිවිතරයන්ට අනුකූල වූ බව රසායනාගාර පරීක්ෂණ වලින් තහවුරු වී ඇතත් ලුණු තොග ලැබුණු පසු කළ නියැදි පරීක්ෂාවට අනුව අවස්ථා 3 කදී ජිප්සම් හා මුහුදු බෙල්ලන් අඩංගු බවද එක් අවස්ථාවකදී ලුණු තොග අට්ටි 2 ක් තුල මඩ අඩංගු බවත් තවත් අට්ටි දෙකක ලුණු තොග පිළිබඳ 2017 දෙසැම්බර් 31 දින වන විටත් රසායනාගාර පරීක්ෂාවක් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iii) ප්‍රමිතියෙන් තොරව මිලදීගත් ලුණු මෙට්‍රික් ටොන් 13,515.52 න් 2017 දෙසැම්බර් 31 දිනටත් රු.207,558,660 ක වටිනා ලුණු මෙට්‍රික් ටොන් 10859 ක් සමාගමේ අවසන් තොග තුළ ඇතුලත්ව ඇති අතර මෙම තොගයද වර්ෂාවට හසුවී විනාශ වෙමින් පැවති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(iv) ගුණත්වයෙන් අඩු ලුණු තොග සමාගමට ලැබී තිබුණද තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර රු.268,637,460 ක් වූ කොන්ත්‍රාත්තුවේ සම්පූර්ණ මුදලට සැපයුම්කරුවන්ට ගෙවීම් කර තිබුණි.

**6.2 ප්‍රමාද වූ ව්‍යාපෘති**

-----------------------

2012 වර්ෂයටත් පෙර ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් රු.1,239,749 ක් වියදම් දැරීමෙන් පසු ඉදිකිරීම අතරමග නවතා දමා තිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිවරයා වෙත වරින් වර අවධානය යොමු කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ඇතැම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල නොකිරීම. |
| (ආ) | ප්‍රසම්පාදනයන් | බාහිර පාර්ශවයන්ගෙන් ප්‍රමිතියෙන් තොර ලුණු තොග විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීමෙන් තොරව මිලදී ගැනීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | මනා කාර්ය මණ්ඩල පරිපාලනයක් සමාගම තුළ ක්‍රියාත්මක නොකිරීම |